# කැලණිය විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

## වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) 2009

## 2010 ඔක්තෝබර්/නොවැම්බර්

**BCOM E 2073 – සංවර්ධන ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 | කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රස්ථාර කඩදාසි සපයනු ලැබේ.

(01) (අ) ආර්ථික වෘද්ධිය සහ ආර්ථික සංවර්ධනය අතර වෙනස්කම් පෙන්වා දෙන්න.

(ලකුණු 10)

(ආ) " ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ 1977 ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් ආර්ථික සංවර්ධනයක් නොව ආර්ථික වෘද්ධියක් පමණක් අත්කර ගෙන ඇත."

ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් කෙතෙක් දුරට ඔබට එකඟවිය හැකිදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(02) (අ) සංවර්ධනය වෙමින් පවත්නා රටවල දිළිදුබාවය පිළිබඳ දුෂ්ඨ චක්‍රයක් නිර්මානය කිරීමට තුඩුදී ඇති විචල්‍යයන් අතර පවත්නා හේතු ඵල සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) මෙම රටවල් සඳහා සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් ලඟාකර ගැනීම පිණිස ඒවා මුහුණ දී ඇති දිළිදුබාවය පිලිබඳ දුෂ්ඨ චක්‍රය කැඩීම සඳහා ආර්ථික විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රධාන න්‍යායන් සාකච්ඡාවට ලක්කරන්න.

(ලකුණු 10)

(03) " බොහෝ ආර්ථික විද්‍යාඥයෝ ආර්ථික සංවර්ධනය පියවරයන් ගෙන් සිදුවී ඇති බැව් පෙන්වීමට උත්සාහ ගනිති "

(අ) ප්‍රධාන ආර්ථික වෘද්ධි පියවර න්‍යායන් කවරේදැයි සඳහන් කර රොස්ටෝව්ගේ ආර්ථික වෘද්ධි න්‍යාය විශේෂයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) තුන්වන ලෝකයේ රටවල් සඳහා සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් අත්කරගැනීමේ දි රෝස්ටෝව්ගේ න්‍යාය මගින් පෙන්වා දී ඇති මගපෙන්වීම් කවරේද ?

(ලකුණු 04)

(ඉ) රොස්ටෝව්ගේ න්‍යාය පිළිබඳ එල්ලවී ඇති ප්‍රධාන විවේචන සඳහන් කරන්න.

(ලකුණු 06)

(04) (අ) ලුවිස්ගේ අතිරික්ත ශ්‍රම න්‍යාය හා බැඳි සිතාගැනීම් සඳහන් කරමින් එම න්‍යාය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) ශ්‍රී ලංකාව වැනි රටකට එම න්‍යායයේ ඇති අදාලත්වය සාකච්ඡාවට ලක්කරන්න.

(ලකුණු 10)

(05) (අ) " ජන සන්ක්‍රාන්තිය " යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද ?

(ලකුණු 04)

(ආ) ජන සන්ක්‍රාන්තිය නැමති සංකල්පය උපයෝගිකර ගනිමින් ශ්‍රී ලංකාවේ ජනගහන උපනතීන් පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

(ලකුණු 10)

(ඇ) සංවර්ධනය වෙමින් පවත්නා රටක සීඝ්‍රයෙන් වැඩිවන ජනගහනයක් පැවතීම පිළිබඳව ඉදිරිපත් වී ඇති විවේචන කවරේ ද ?

(ලකුණු 06)

(06) (අ) තුන්වන ලෝකයේ රටවල් සඳහා සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් අත්කර ගැනීමේ දී කෘෂිකර්මයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ආ) දියුණු වෙමින් පවත්නා රටවල් කාර්මීකරණය පිළිබඳව උනන්දුවක් දක්වන්නේ මන්ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඉ) කාර්මීකරණය සඳහා එම රටවල් විසින් මෙතෙක් අනුගමනය කරන ලද විවිධ උපක්‍රමවල සාර්ථකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු 06)

(07) (අ) ආර්ථිකයක ජාතික ඉතිරිකිරීම් මට්ටම 15% ක් වන අතර එහි ප්‍රාග්ධන -නිමවුම් අනුපාතය 5 ක් යැයි උපකල්පන කරමින් හැරඩ්-ඩෝමාර් ආකෘතිය පදනම් කරගෙන මෙම රටට අත්කරගත හැකි ආර්ථික වෘද්ධිය කොපමණදැයි සොයන්න.

(ලකුණු 10)

(ආ) මෙම ආර්ථිකයට ඉදිරි වසරේ දී 5 % ක ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීමට අවශ්‍යනම් ඉහත ආකෘතිය යටතේ අදාල ගනනයන් කරමින් එම ඉලක්කය අත්කර ගැනීම සඳහා භාවිතා කළහැකි ක්‍රියාමාර්ගයන් කවරේදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 10)

(08) පහත සඳහන් දෑ පිළිබඳ කෙටිසටහන් ලියන්න.

(අ) මානුෂ ප්‍රාග්ධනය

(ආ) ද්විත්ව ආර්ථිකය

(ඉ) ගිනී සංගුනකය

(ඊ) නිෂ්පාදනයේ ප්‍රාග්ධන සූක්ෂමතාවය

(ලකුණු 20)